

# මහනුවර වැව රවුමයි මගේ යහළුවෝයි

ඉනුකි ලිතුම්සා බණ්ඩාර



# මහනුවර වැව රවුමයි මගේ යහළුවොයි

ප්‍රථම එළිදැක්වීම - 15.11.2023

ISBN 978-624-206-671-4

ඉනුකි ලිතුම්සා බණ්ඩාර

# පිදුම

මෙම පොත
මගේ ගුරු මෑණිවරුන්ට
හා පියවරුන්ට
පුදමු.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි .

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

**ශෂිකලා සේනාධීර**
**විදුහල්පතිනිය**
**මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර**
**2023.11.01**

මගේ පාසල මහනුවර මහාමායා බාලිකා විදුහලයි. මම උදේ සවස වැව රවුම දිගේ ඇවිදගෙන යනවා. මගේ අක්කාගේ පන්තිය ඉවරවෙන තුරු මම වැව රවුමේ ඉදන් ඉන්නවා. මගේ යහළු සත්තු හැමදාම මට හම්බවෙනවා. මම මගේ යහළු සත්තුන්ට කෑම දෙනවා. මගේ පොතේ මගේ යහළුවෝ පිටුවෙන් පිටුවට එනවා.



# ඔටුමානා (Pelican)

ඔටුමානා හැමදාම වගේ වැවට එනවා. එයාගේ හොටය ලොකුම ලොකුයි. එයාගේ හොටේ ලොකු කෑම මල්ලක් තියෙනවා. එයා මාළු කනවා. මාළු අල්ලනවා මම දැකලා තියෙනවා.



# තාරා පවුල

තාරා අම්මයි පැටවුයි. මම වැව රවුමේ වාඩි වෙලා ඉන්නකොට තාරා පවුල හැමදාම මා ළඟට එනවා. මම එයාලට පාන් කෑලි දෙනවා. ඒගොල්ලෝ කෑම කලා සතුටින් වැවට බසිනවා.



# කබරගොයා

කබරගොයා හැමදාම වැව අයිනේ ඉන්නවා. එයා කළු පාටයි, කහ පාට පුල්ලි තියනවා. එයා වතුරෙයි, ඉවුරෙයි දෙකේම ඉන්නවා. එයා පුංචි සත්තු අල්ලන් කනවා මම දැක්කා.




# කොක්කු ගස

කොක්කු ගොඩක් වැව් ඉවුරේ කොනක ඉන්නවා මම දැක්කා. එතන කොක්කු සියයක් විතර ඉන්නවා. කොක්කු ගසේ කොක්කු සුදුම සුදු පාටයි. කොක්කු වසුරු බිම වැටිලා සුදුම සුදු පාටයි.



# ඉබි පවුල

ඉබි පවුලත් හැමදාම වැවේ පීනනවා මම දැකලා තියෙනවා. එයාලා අව්ව තපින්නේ වැවට වැටිච්ච ගසක් උඩ. ඉබි යාළුවෝ වතුරෙයි වැව් ඉවුරෙයි ඉන්නවා මම දැක්කා.



# මාළු රංචුව

වැවේ මාළු දාහක් විතර ඉන්නවා. මම මාළුවන්ට හැමදාම කෑම දානවා. එයාලා ඒවා සතුටින් කනවා. රණ්ඩුත් වෙනවා.



# පිළිහුඩුවා

හැමදාම වැව දිහා බලන් ඉන්නවා. එයා වැවේ ඉන්න කක්කුට්ටෝ අල්ලා ගන්නවා මම දැක්කා. පිළිහුඩුවා නිල් පාටයි. හොට කළු පාටයි.



# දියකාවා

දියකවා පිහිණුම් ශූරයෙක්. එයා හැමදාම අපිට පෙන්න වතුරේ හැංගෙනවා. මාළු අල්ලන් බඩ පුරවා ගන්නවා.



# අළු කොබෙයියා

අළු කොබෙයියෝ පෝඩුවක් වැව රවුමේ කෑම හොයනවා, මම දකිනවා. ඇඟ අළු පාටයි. බෙල්ල නිල් සහ දම් පාටයි. කළු පාටින් තටු හැඩ වෙලා.



# මයිනා

ඇඟ දුඹුරු පාටයි. ඔළුව කළු පාටයි. හොටය කහ පාටයි. වැව රවුමේ තියන කෑම ජාති කන්න එයත් හරි ආසයි.





# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචානා කරන්නට විය ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්මින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු . .

**මෙයට**
**සෙනෙවිරත්න මහලේකම්**
**පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක**
**2023.11.01**